පුවත්පත් නිවේදනය

යොමුව- නාරා/පාලන/2022/68/RL/ටෙන්ඩර් අංක 26

# ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

## ජාතික ජලජ සම්පත් පර්යේෂන හා සංවර්ධන නියෝජිතායතනය,කාක දූපත , මට්ටක්කුලිය ,කොළඹ-15

ජාතික ජලජ සම්පත් පර්යේෂන හා සංවර්ධන නියෝජිතායතනයේ (නාරා)සිට කළුතර දක්වා කාර්ය මණ්ඩළය ප්‍රවාහනය කිරිම සඳහා ප්‍රසම්පාදන මණ්ඩළය විසින් මාසිකව ගෙවීමේ පදනම මත කුළී වාහන ලබා ගැනීම වෙනුවෙන් ලංසු ඉදිරිපත් කරන ලෙසට මෙයින් ආරාධනා කරමි.

අදාළ වන්නාවූ විස්තර සහිත ලංසු ආකෘති හා ලංසු ආරාධනා ලේඛණය ලබා ගත හැක්කේ ආපසු නොගෙවන රු:1,000.00 ක මුදල් තැන්පතුවක් අධ්‍යක්ෂක ජනරාල්,නාරා නමින් තැන්පත් කිරිමෙන් පසුව මිලදී ගැනුම් හා සැපයුම් ඒකකය වෙතිනි.

01.අවශ්‍ය කෙරෙන වාහන පංතිය,ගමන් මාර්ගය හා අනෙකුත් පිරිවිතරයන් පහත දක්වා ඇත.කොන්ත්‍රාත් කාලය එක් වසරක් වේ.

| ප්‍රවාහන සේවාව | ගමන් මාර්ගය | එක් ගමන් මාර්ගයක දූර කි.මී<br>නාරා සිට කළුතර බස් නැවතුම් පළ දක්වා | ආරම්භ කළ යුතු වේලාව හා ස්ථානය | ආපසු ගමන් කළ යුතු වේලාව හා ස්ථානය | වාහන පංතිය |
|---|---|---|---|---|---|
| නාරා-කළුතර | උදෑසන-<br>කළුතර බස් නැවතුම ඉදිරිපිට සිට ගාලු පාර ඔස්සේ කොටුව දුම්රියපොළ ඉදිරිපිට මල්වත්ත පාරේ සිට අබ්දුල් කාදර් මාවත (රෙක්ලමේෂන් පාර)අලුත් මාවත පාර,විස්ට්වයික් පාර,සී බීච් පාර,නාරා පාර ඔස්සේ මට්ටක්කුලිය කාක දූපත නාරා ප්‍රධාන කාර්යාලය.<br>සවස-<br>නාරා ප්‍රධාන කාර්යාලයේ සිට නාරා පාර,සී බීච් පාර,විස්ට්වයික් පාර,අලුත්මාවත පාර,කේ සිරිල් සී පෙරේරා මාවත,බ්ලූමැන්ඩල් පාර,ආමර් විදිය,පංචිකාවත්ත,මරදාන දුම්රිය පොළ, ටෙක්නිකල් හන්දිය,පිටකොටුව හරහා ගාලු පාර ඔස්සේ කළුතර බස් නැවතුම දක්වා. | උදෑසන ගමන් වාරය-<br>කි.මී 50.0<br>සවස ගමන් වාරය-<br>කි.මී 52.7 | පෙ.ව 06.20 ට කළුතර බස් නැවතුම ඉදිරිපිට සිට (මාර්ග තදබදය මත වේලාව සංශෝධනයට යටත් වේ)<br>කොටුව මල්වත්ත පාරට උදෑසන 08.05 වන විට පැමිණිය යුතුවේ. එම ස්ථානයෙන් පෙ.ව8.10 ට නාරා දක්වා ගමන් ආරම්භ කල යුතුය. | ප.ව 04.20 ට කොළඹ-15 මට්ටකුලිය නාරා ප්‍රධාන කාර්යාලයෙන් | ආසන 38 |

02.ලංසුවේ වලංගු කාලය ලංසු භාර ගන්නා අවසාන දිනයේ සිට වැඩකරන දින 90 ක් එනම්, 2022 ඔක්තෝම්බර් මස 31 තෙක් විය යුතුය.

03. ලංසු ඉදිරිපත් කිරීමේදී ප්‍රවාහන සේවාව සඳහා ලංසු සුරක්ෂණ ප්‍රකාශයක් සමග පිළිගත් වාණිජ බැංකුවකින් ලබා ගත් රු:15,000.00 ක ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතුය.

04.ලංසු ඉදිරිපත් කිරීමේදී ආකෘතියේ කපා හෝ මකා හෝ වෙනයම් ආකාරයකින් හෝ වෙනසක් සිදු කරන්නේ නම් එම ස්ථානයන් හි ස්වකීය කෙටි අත්සන හා මුද්‍රාව යොදා එම වෙනස් කිරීම සහතික කළ යුතු අතර,එසේ නොවන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. අදාළ වන්නා වූ විස්තර සහිත ලංසු ආකෘති හා ලංසු ආරාධනා ලේඛණය නිකුත් කරනු ලබන්නේ 2022 ජූනි මස 08 සිට 2022 ජූනි මස 27 වන දින දක්වා පමණි.මේ සම්බන්ධ පූර්ව ප්‍රසම්පාදන රැස්වීම 2022 ජූනි මස 21 දින පෙ.ව 10.00 ට නාරා අධ්‍යක්ෂක ජනරාල් කාර්යාලයේදී පැවැත්වේ.

07.මුද්‍රා තබන ලද ඔබගේ ලංසුව 2022 ජූනි මස 28 වන දින ප.ව 01.00 ට පෙර ''සභාපති,ප්‍රසම්පාදන කමිටුව, ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනනාය,කාක දූපත,මට්ටක්කුලිය,කොළඹ-15 යන ලිපිනයට ,ලියාපදිංචි තැපැලෙන් හෝ ප්‍රධාන ගොඩනැගිල්ලේ පළමු මහලේ පිහිටා ඇති මුදල් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටි අංක-01 ට බහාලීමෙන් හෝ ඉදිරිපත් කළ හැකිය.

ලංසු බහාලන කවරය මුද්‍රා තබා ඉදිරිපත් කළ යුතු අතර,එම කවරයේ වම්පස ඉහළ කෙළවර "නාරා-කළුතර දක්වා කාර්ය මණ්ඩල ප්‍රවාහන සේවාව සඳහා මිළ ගණන් කැඳවීම-2022/ටෙන්ඩර් පෙට්ටි අංක- 01" යනුවෙන් සඳහන් කළ යුතුය.

08.2022 ජූනි මස 28 දින ප.ව 01.00 ට ඉදිරිපත් වී ඇති ලංසු එදින එම වේලාවට ජාතික ජලජ සම්පත් පර්යේෂන හා සංවර්ධන නියෝජිතායතනනයේ (නාරා) මුදල් අංශයේදී විවෘත කරනු ලබන අතර ,එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයකුට සහභාගී විය හැකිය.

09.මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු අවශ්‍ය නම්,ප්‍රසම්පාදන නිළධාරී මගින් ලබා ගත හැකිය.

ප්‍රසම්පාදන කමිටු තීරණය අවසන් තීරණය වේ.

සභාපති
ප්‍රසම්පාදක මණ්ඩලය
ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය
කාක දූපත ,මට්ටක්කුලිය
කොළඹ15-
0112/529717 -0112-521000

දිනය-2022 ජූනි මස 08